ශ්‍රී ලාංකේය සිනමාවේ පමණක් නොව දේශපාලන පොර පිටියේද විවාදාත්මක චරිතයක් වූ ඒ අසාමාන්‍ය මිනිසා මා ඉදිරියේ වාඩි වී සිටින්නේ ප්‍රසන්න සිනාවකින් මුව සරසාගනිමින් ය. සිය ප්‍රථම සිනමා නිර්මාණයේ වැඩ කටයුතු වලින් වෙහෙසට පත්ව සිටිය ද ඒ බව සඟවා ගනිමින් මා සමග කතා බහක යෙදෙන්නට ඔහු සමත් වෙයි. මේ පිළිසඳර කෙළෙස ආරම්භ කළ යුතු දැයි මම කල්පනා කරමින් සිටින්නෙමි. අවසන මම මෙසේ අසමි.

සනත් ගුණතිලක කියන්නෙ කොයි වගේ මනුස්සයෙකුටද?

බොහෝ අවස්ථා වලදී තමන්ට වඩා අනුන්ගේ සුබ සිද්ධිය සොයන මනුස්සයෙක්. අනුන් වෙනුවෙන් හඬක් නගන සමහර විට අතින් පාඩු කරගන්නා මනුස්සයෙක් කියා කිව්වොත් මගේ හෘදය වස්තුව එළියේ තියා කතා කළා වගෙයි.

කළා. මාධ්‍ය උපදේශකවරයකු ලෙස. නමුත් වඩා ක්‍රියාකාරී වෙන්නෙ සිනමාවේ යහපත ගැන උනන්දු වෙලා ඒ ගැන ප්‍රේමදාස මහත්තයා සමග සාකච්ඡා කරන්න යාමෙන්. ඒක පළාත් සභා මන්ත්‍රීවරයකු සිට පසු කළෙක ජනාධිපති මාධ්‍ය උපදේශකයෙක් දක්වා විහිදිලා යන්නෙ දේශපාලනයට තියෙන කැමැත්ත නිසා නෙවෙයි. සිනමාවේ සුබසිද්ධිය වෙනුවෙන් වැඩක් කරන්න හිතේ තිබුණ කැමැත්ත නිසයි.

නමුත් ඔබට චෝදනාවක් තිබෙනවා යමක් කරන්න බලයක් තිබුණ මොහොතේදී වත් ඔබ සිනමාව වෙනුවෙන් යමක් කළේ නැහැයි කියලා. ඔබ ඒ චෝදනාවට එකඟ ද?

එකඟ නැහැ. බොහෝ විට ඒ චෝදනාව ගෙන එන්නෙ මම සිනමාව වෙනුවෙන් මෙහවරක් කරපු බව හොඳින්ම දන්න කට්ටියමයි. සංවෘත ආර්ථිකය යටතේ තිබුණ චිත්‍රපට සංස්ථා පනත විවෘත ආර්ථිකයට අප යොමුවෙලා අවුරුදු 30 කටත් වඩා

පමණක් නොව ලෝක වාසීන්ටමත් දැනගන්න හැකිවෙයි.

අද ඔබ ඉන්න තැන..?

අද මම නලුවෙකු විදිහට ගෙනාපු ඒ කීර්තිමත් පරිච්ඡේදය නිර්මාණකරුවකු ලෙසත් තව ඉදිරියට ගෙන යාමට ජනතා සහ විචාරක ආශිර්වාදය ලබමින් සිටිනවා.

ඔබේ රංගන දිවියේ විශිෂ්ටම මං සළකුණ තමයි විරාගය චිත්‍රපටයේ අරවින්ද ගේ චරිතය. මේ චරිතයට ඔබ තෝරා ගැනීම ගැන මතකය අවදි කරමුද?

මුලින්ම තිස්ස අබේසේකර ඒ චරිතය සඳහා මාව තෝරා ගන්නෙ මා සතු රූපය නිසා. ඔහු එය මට පැවසුවේ මා කලියුගය චිත්‍රපටයේ ඇලන් ගේ චරිතය නිරූපනය කළ පසු. කවදා හෝ විරාගය කිරීමට ලැබුණොත් මාව තෝරා ගන්නා බවට ඔහු නිගමනය කර තිබුණා. නමුත් ඒ තෝරා ගැනීම වඩාත් නිවැරදි යයි

අනිවාර්යයෙන්ම එහෙම වුණා. රංගන කාර්යයට කාලය මිඩංගු කිරීමට නොහැකිවීම ගැන මම අනිවාර්යයෙන්ම කණගාටු වෙනවා. නමුත් දේශපාලන භූමිකාව තුළින් මම දැනගත්ත බොහෝ දෑ විශේෂයෙන්ම විවිධ තරාතිරමේ මිනිස්සු ගැන මම අවුරුදු 100 ක් ජීවත් වුණා වගේ කියලා මට හිතෙනවා. පසු කළෙක රාජ්‍ය සේවය පිණිසයි ආගන්තුකයා වැනි චිත්‍රපට වල දේශපාලනඥයාගෙ ' චරිතය රඟපෑමේදී මා රඟපෑවාද නැත්නම් රඟනොපා චරිතය තුළම ජීවත් වුණා ද කියා තෝරා ගන්න බැරි තරමට මේ අත්දැකීම් රංගන කාර්යයේදී මට ඉවහල් වුණා.

ඔබේ ඉදිරි මග සකස් වෙන්නෙ කොහොමද?

මගේ එකමත් එක රටක චිත්‍රපටයට ලැබී තිබෙන ප්‍රතිචාර දිරිමත් කිරීම් හා ආශිර්වාද මත මට අවශ්‍ය කලා දිවිය දිගටම ගෙනයාමටයි. නමුත් මේ රටේ ජීවත්වන පුරවැසියෙක් විදිහට රට වෙනුවෙන් යම් කිසි සේවාවක් කළ යුතු යයි මා වෙත යෝජනා

# එයාලට මාව අමතක වුණාට මම මොනවා කරන්නද?



## සනත් ගුණතිලක සමග සැන්දෑවක්

සාකච්ඡා කළේ
**ජගත් ජේ එදිරිසිංහ**

***ඕනෑම මනුස්සයෙකුට දේශපාලනය නිසා හොඳ හා නරක ස්වරූපයක් ආරෝපනය වෙනවා. බොහෝ විට වෙන්නෙ නරක. මම දේශපාලනයට යොමු වෙන්නෙ සිනමාව ගැන කතා කරන්න ගිහින්. මගේ සිනමාව හරහා ලබා ගත් මාධ්‍ය සහ ප්‍රචාරණ දැනුම 1985 දී පමණ ගාමිණී දිසානායක මහත්තය පාවිච්චි කළා. මාධ්‍ය උපදේශකවරයකු ලෙස. නමුත් වඩා ක්‍රියාකාරී වෙන්නෙ සිනමාවේ යහපත ගැන උනන්දු වෙලා ඒ ගැන ප්‍රේමදාස මහත්තයා සමග සාකච්ඡා කරන්න යාමෙන්. ඒක පළාත් සභා මන්ත්‍රීවරයකු සිට පසු කළෙක ජනාධිපති මාධ්‍ය උපදේශකයෙක් දක්වා විහිදිලා යන්නෙ දේශපාලනයට තියෙන කැමැත්ත නිසා නෙවෙයි. සිනමාවේ සුබසිද්ධිය වෙනුවෙන් වැඩක් කරන්න හිතේ තිබුණ කැමැත්ත නිසයි.***

ඔබේ දේශපාලනයට ගැන කතා කරමුද?

ඕනෑම මනුස්සයෙකුට දේශපාලනය නිසා හොඳ හා නරක ස්වරූපයක් ආරෝපනය වෙනවා. බොහෝ විට වෙන්නෙ නරක. මම දේශපාලනයට යොමු වෙන්නෙ සිනමාව ගැන කතා කරන්න ගිහින්. මගේ සිනමාව හරහා ලබා ගත් මාධ්‍ය සහ ප්‍රචාරණ දැනුම 1985 දී පමණ ගාමිණී දිසානායක මහත්තය පාවිච්චි

ගෙවිලත් තාම වෙනස් වෙලා නැහැ. වෙනස් වූ ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක ආර්ථිකයට සරිලන විදිහට චිත්‍රපට සංස්ථා පනත හෝ චිත්‍රපට පිළිබඳ ප්‍රතිපත්තිය හෝ සකස් වෙලා නැහැ. ඕකයි මූලික ගැටලුව. සිනමාව වෙනුවෙන් ස්ථිරසාර ප්‍රතිපත්තියක් හැදීමේ කටයුත්ත මුලින්ම පටන් ගත්තෙ මම. 1996 දී. නමුත් 2000 දී මම සමුග න්නා විටත් ඒ වැඩ කටයුතු නිමා කිරීමේ හැකියාව අපට ලැබුණේ නැහැ. අපට ලැබුණේ ඒ සඳහා මූලිකව සකස් කළ කෙටුම් පතක් හා චක්‍ර ලේඛයක් පමණයි. අදටත් තිබෙන ප්‍රධානතම ගැටලුව එයයි. පසුගිය වසර 9 තිස්සේ ඒ ගැටලු විසඳීමට උනන්දු නොවූ පිරිසමයි මේ චෝදනාව මට කරන්නෙ.

නමුත් වර්තමාන ජනාධිපති තුමා මා විශ්වාස කරන විදිහට නුදුරු දිනයකදී මේ ප්‍රශ්නයට අතගැසූ විට (මෙතක් එතුමාට එය කළ නොහැකි වුණේ රටට සාමය ගෙන ඒම මූලික කාර්යය වූ නිසයි) මේ සියල්ලම එළිවෙයි. මේ සියල්ලම විසඳෙයි. සත්‍යය අසත්‍යය ලාංකික

ඔහු තීරණය කරන්නේ මා සමග තිබූ කිට්ටු සබඳතාව මත. මා යම්කිසි කාර්යයකට අවතීර්ණ වූ පසු සියළු දේ පසෙක ලා එම කාර්යය නිමවන තුරු කරන කැපවීම ඔහු හොඳින් නිරීක්ෂණය කර තිබූ නිසා බව පසු කලෙක මා සමග පැවසුවා.

අරවින්දගේ චරිතය නිරූපනය කිරීම සඳහා ඔබ දැඩි කැපකිරීමක් කළ බව ප්‍රසිද්ධයි. මේ සඳහා ඔබ ඔබේ පෙනුම පවා වෙනස් කර ගත්තා.

ඔව්. ඒ සියල්ල අධ්‍යක්ෂවරයාගේ චින්තනය මත යි සිදුවුණේ. ඒ කැපවීම ඔහුට අවශ්‍ය වුණා. ඔහුගේ අවශ්‍යතාවටත් වඩා ඔබ්බට එම කටයුත්ත කරන්න මම උත්සාහ කළා. මට හොඳට මතකයි චිත්‍රපටයේ තිර රචනය මට දීලා වගකීම බාරදෙන අවස්ථාවේදීම මම ඉල්ලා සිටියා මට මගේ රූපකාය වෙනස් කරගැනීමට අවශ්‍ය බැවින් දර්ශනගත කිරීම තිර නාටකයේ අනුපිළිවෙලටම කරන ලෙස. ඔහු එයට එකඟවුණා. ඒ එකඟවීම මගේ කැපකිරීමේ කටයුත්තට විශාල රුකුලක් වුණා. එය චිත්‍රපටයේ සාර්ථකත්වයට විශාල හේතුවක් වුණා.

රංගනය කෙරෙහි ඒ සා කැපකිරීමක් කළ ඔබ පසු කළෙක එයින් බැහැර වුණා. අද ඒ ගැන මොකද හිතෙන්නෙ?

බොහෝ ලැබෙනවා. ඒ සියල්ල මම ඉතා උපේක්ෂාවෙන් ඉවත ලෑමට උත්සාහ කළත් එය එක දිගටම කිරීමට බැරි වේ යයි මට හැඟීගොස් තිබෙනවා. මා දැනට ඒ පිලිබඳව කියන්නට දන්නේ එපමණයි.

රජයෙන් ඔබට ආරාධනාවක් ලැබෙන්නෙ නැද්ද?

ජනාධිපති මහින්ද රාජපක්ෂ කියා කියන්නෙ ඕනෙම පූසෙකුගෙන් වැඩක් ගන්න දන්න කෙනෙක්. ඒ වගේම දේශපාලනඥයකු විදිහට ඔහු තුළ ඇති කෙනෙකු ආකර්ශනය කර ගැනීමේ හැකියාව ගැන හැමෝම දන්නවා. එවැනි ශූර පුද්ගලයෙක් මා වැන්නකුව නිකරුණේ නිදහසේ තබයි ද?

ඔබේ එකමත් එක රටක සිනමාපටයේ තිරනාටකය ලිව්වෙත් ඔබම යි. ඒ ගැන කතා කරමුද?

විදෙශීය කෙටිකතාවක් තිරනාටකයකට සකස් කිරීමේදී තිරනාටක රචකයකු වශයෙන් මා තුළ ඇති ආධුනිකබව නිසා විශාල වෙහෙසක්

15 වන පිටුවට